සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව පිළිතුරු

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 3 | (21) | 4 | (31) | 3 |
| (02) | 3 | (12) | 2 | (22) | 1 | (32) | 3 |
| (03) | 4 | (13) | 1 | (23) | 3 | (33) | 4 |
| (04) | 2 | (14) | 2 | (24) | 2 | (34) | 1 |
| (05) | 3 | (15) | 1 | (25) | 1 | (35) | 1 |
| (06) | 1 | (16) | 3 | (26) | 4 | (36) | 1 |
| (07) | 1 | (17) | 4 | (27) | 2 | (37) | 3 |
| (08) | 1 | (18) | 1 | (28) | 3 | (38) | 4 |
| (09) | 2 | (19) | 2 | (29) | 4 | (39) | 1 |
| (10) | 1 | (20) | 3 | (30) | 1 | (40) | 2 |

(ලකුණු 1 × 40 = 40)

### II කොටස

(01) (1) දික්තල කාලගෝල, පුණ්‍යසේන ගුණසිංහ (ලකුණු 02)

(2) කාලගෝල (ලකුණු 02)

(3) දික්පිටියා (ලකුණු 02)

(4) කාලගෝලගේ බිරිඳ වූ දික්තල රවටාගෙන තම බිරිඳ කර ගැනීම සඳහා ඇය රැගෙන යාමට උත්සහ කිරීම. (ලකුණු 02)

(5) කාලගෝල අවුරුදු හතක් බැල මෙහෙවර කර විවාහ කරගත් දික්තලා ය. ඇය ඔහු සමඟ විවාහ වී ඇත්තේ දෙමාපිය බල කිරීම මතය. (ලකුණු 02)

(6) කාලගෝල හා දික්පිටියා අතර ගුටි බැට හුවමාරුවක් ඇතිවන අතර, එම ස්ථානයට මහෞෂධ පඬිතුමාගේ ගෝලයකු වූ චත්තුදත්ත පැමිණේ. ඔහු මෙම තිදෙනාම මහෞෂධ පඬිතුමා වෙත පමුණුවන බව ප්‍රකාශ කිරීමෙන් මෙම දර්ශනය අවසන් වේ. (ලකුණු 02)

(02) (1) කොහොඹාකංකාරිය/ කොහොඹා යක්කම/ කොහොඹා යක් කංකාරිය (ලකුණු 02)

(2) සෙත් ශාන්තියක් ලබා ගැනීම/ සශ්‍රීකත්වය සහ සෞභාග්‍යය උදෙසා / අපල උපද්‍රව දුරු කර ගැනීම. (ලකුණු 04)

(3) විජය රජු කුවේණියට දුන් ප්‍රතිඥාව කඩ කිරීම හේතුවෙන් ඔහුගෙන් පසුව රජ වූ පඬුවස් දෙව් රජුට දිවි දෝෂය වැළඳීම හා සම්බන්ධ කතා පුවත ලියා තිබිය යුතු ය. (ලකුණු 06)

(03) (1) "ප්‍රේක්ෂක හෝ ශ්‍රාවක පිරිසක් ඉදිරියේ ජීවමානව ඉදිරිපත් කරන කලාව ප්‍රාසාංගික කලාව වේ."
"ගායනය, රංගනය, චලනය, පදනම් කරගෙන ශිල්පියාගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් රංග භූමියක කෙරෙන නිරූපණ කලාව ප්‍රාසාංගික කලාව වේ."
යන නිර්වචන දෙකෙන් එකක් ඉදිරිපත් කර තිබිය යුතු ය. (ලකුණු 02)

(2)
- සජීවී බව
- අභිනය භාවිතය
- විනෝදාස්වාදය ප්‍රමුඛ වීම.
- අනුශාංගික අංග භාවිත වීම.
- රංග භූමියක් භාවිතා කිරීම වැනි ආකාරයේ ලක්ෂණ හතරක් දක්වා තිබීම. (ලකුණු 04)

(3) නාට්‍ය, නර්තනය, සංගීතය යන ප්‍රාසාංගික කලාවන් තුනක් නම් කර ඉන් එක් ප්‍රාසාංගික කලාවක් පිළිබඳ කෙටියෙන් විස්තර කර තිබීම අවශ්‍ය වේ. (ලකුණු 06)

(04) (1)
- ධාරාලෝක පහන
- යොමු පහන
- අල්ට්‍රා වයලට් පහන
- වර්ණ චක්‍ර පහන
- ස්ට්‍රිප් පහන (ලකුණු 02)

(2)
- සමූහයක් අතුරින් පුද්ගලයෙකු විශේෂ කර පෙන්වීම.
- විශේෂ කාර්යන් හුවා දැක්වීම
- අවස්ථා වඩා තීව්‍ර කිරීම
- පරිසරය හුවා දැක්වීම
- සියුම් රංගන අවස්ථා කෙරෙහි අවධානය යොමු කිරීම.
- පසුතල සවිකිරීමට සහ ඉවත් කිරීමට
- දර්ශන මාරු කිරීමට (ලකුණු 04)

(3) අතීතයේ මෙරට පැවති ශාන්තිකර්ම සහ ගැමි නාටක සඳහා පන්දම්, කොප්පරා පහන්, දුම්මල කීරි ගැසීම වැනි දෑ භාවිත කළ අතර, පසුව කිට්සන් පහන්, ගෑස් ආලෝකය භාවිතයෙන් රංග භූමි ආලෝක කරගත් ආකාරය විස්තර කිරීම. (ලකුණු 06)

(05) (1) කෝලම් යනු දේශීය ජන නාටකයක් වන බව ද, "කෝලම්" යන්න වෙස් මුහුණු පැළඳ නැටීම යනුවෙන් අර්ථ ගැන්වෙන බව ද ප්‍රකාශ වීම. පහත රට ප්‍රදේශයේ ප්‍රචලිත වී ඇති බව ද සඳහන් වීම. (ලකුණු 02)

(2) කෝළම් රඟ මඩල ඇඳ එහි ප්‍රධාන කොටස් හතර ඇඳ මඩුව, වෙස් අත්ත, කෝලම් සබය, මල් පැළ යන කොටස් හතර නම් කර තිබීම. (ලකුණු 04)

(3) - වෙස් මුහුණු භාවිතය
- දේශීය ගැමි ගායනා ඇතුළත්ව තිබීම
- සියලු චරිතවලට අනන්‍ය වූ නර්තන ශෛලියක් තිබීම.
- පූර්ව රංගයක් සහ අපර රංගයක් තිබීම.
- පහතරට ශාන්තිකර්මවල ආභාෂය ලබා තිබීම.
- විවිධ චරිත වර්ග ඇතුළත්ව තිබීම.
- තානායම් පොළ නම් රංග ස්ථානයක් භාවිතා කිරීම.
- සමාජයේ දුබලතා හාස්‍යයට හා තියුණු උපහාසයට ලක් කිරීම. (ලකුණු 06)

(06) (1) වාචික අභිනය (ලකුණු 02)

(2) - නාට්‍ය අවස්ථා තීව්‍ර කිරීම
- නාට්‍යමය අවස්ථා අතර සම්බන්ධය රැක ගැනීමට
- තේමාව ප්‍රකාශ කිරීමට
- ප්‍රේක්ෂකයා තුළ රස ජනනය කිරීම
- නිර්මාණාත්මක බව, විවිධත්වය විචිත්‍රවත් බව මැවීම
- නාට්‍ය ගීත ගායනයට (ලකුණු 04)

(3) සිසුවා නැරඹූ නාට්‍යයක සංගීතය පිළිබඳව නිවැරදිව හා තර්කානුකූලව කෙටි විස්තරයක් කර තිබීම සලකා ලකුණු ලබා දෙන්න.

(07) දෙන ලද කතා සාරාංශය ඇසුරු කරගෙන

(1) පසුබිම, කාලය, චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කර තිබීම (පිටපත තුළින් මේවා ප්‍රකාශ විය යුතුයි.) (ලකුණු 04)

(2) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාවක් ගොඩනංවා තිබීම. (ලකුණු 04)

(3) පැහැදිලිව නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය වන සේ පිටපත රචනා කර තිබීමට. (ලකුණු 04)